## මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව

## 2022 මැයි 24 වන දින

❖ **08 වන සැසි වාරයේ 49 වන සභා වාර්තාව**

**දිනය :- 2022.05.24 වන දින**

**වේලාව :- පෙ.ව.10.00**

**ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මීද්දෙණිය**

පැමිණීම

| | |
|---|---|
| 01. ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. ගරු ප්‍රා. ස. ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් තුෂාර ගුරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ජ්. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම. ජ්.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10.ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 11. ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව.10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 14. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 17. ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම. සුගත් සරබගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රා.ස.ම. එච්.ජී. ගාමිණි සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 20.ගරු ප්‍රා.ස.ම. එච්.ජී. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය. | පෙ.ව. 10.00 |

21.ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිශ්චන්ද්‍ර මැතිතුමා — පෙ.ව. 10.00

22. ගරු ප්‍රා.ස.ම. එන්.ජී.එය්. වීරසිරි මැතිතුමිය. — පෙ.ව. 10.00

23. ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය. — පෙ.ව. 10.00

24. ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පත්ම තිලක් මැතිතුමා. — පෙ.ව. 10.00

25. ගරු ප්‍රා.ස.ම. ඒ.බී. ඉන්දික මැතිතුමා. — පෙ.ව. 10.00

<u>නොපැමිණීම</u>

01. ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා

02. ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා

03. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ. සංජීව මැතිතුමා.

04. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය

<u>සහභාගී වූ නිලධාරින්</u>

01. ලේකම් (වැ.බ) - එම්.දිනුජිත් රන්දුල මයා.

02. කළමනාකරණ සේවා නිලධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

<u>ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගී වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ මැයි මස මහ සභා රැස්වීම සඳහා සහභාගී වූ ගරු උප සභාපතිතුමන්, හිටපු සභාපතිතුමන්ලා , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගී වූ ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන්. ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

<u>**01.පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.**</u>

2022 අප්‍රේල් මස 21 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියෙවුවා සේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

නිහඬතාවයෙන් පෙනී යන්නේ පසුගිය සභා වාර්තාවේ සංශෝධන නොමැති බවයි. ඒ අනුව සංශෝධන රහිත වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 අප්‍රේල් මස 21 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන

### 02-01 රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මේ චක්‍ර ලේඛයේ පිටපතක් සියලුම දෙනාට ලබා දීලා තියෙනවා. ඒ ගැන දැනුවත් වෙන්න. භාණ්ඩාගාර ලේකම්ගේ අත්සනින් යුතුව ඉදිරිපත් කරලා තියන මේ ලිපිය අනුව රාජ්‍ය වියදම් ඉතාම අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා පමණක් යොදා ගන්නා ලෙස උපදෙස් ලබා දීලා තියෙනවා. මේ සඳහා අවධානය යොමු කරමින් අපි හැකි පමණ වියදම් සීමා කරමින් කටයුතු කරමු.

### 02-02 ගරු ප්‍රා.ස.ම. ගාමිණී සංජීව මැතිතුමන්ගේ මෑණියන්ගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීම

අපේ සභාවේ ගරු ප්‍රා.ස. ම. ගාමිණී සංජීව මැතිතුමන්ගේ මෑණියන් පසුගිය දින වල අභාවයට පත් වුණා. රටේ පැවතුණු තත්වය අනුව අපිට ඒ සඳහා සහභාගී වීමට නොහැකි වුවත් ඒ වෙනුවෙන් කටුවන ප්‍රාදේශිය සභාවේ සියලූ සියලුම මන්ත්‍රී මණ්ඩලයේ සහ ලේකම් තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

## 03. ප්‍රාදේශිය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන - නැත

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා.

### 05 – 1. පුස්තකාල පරිහරණය සඳහා නිර්දේශිත කෘතියක් මිලදී ගැනීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

පුස්තකාල පරිහරණය සඳහා නිර්දේශිත කෘතියක් මැයෙන් අංක 59, බොරැල්ල පාර, දෙපානම, පන්නිපිටිය ලිපිනයෙහි පදිංචි මොහාන්දාස් සමරක්කොඩි මහතා විසින් 2022.04.18 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි ඔහු විසින් රචිත "පාසල ක්ෂේම භූමියකි" කෘතිය ප්‍රාදේශිය සභාවේ පුස්තකාල හතර සඳහා පිටපත් දෙක බැගින් පිටපත් 8ක් සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු බවත් ඉදිරියේදී පුස්තකාල සඳහා කෘති මිලදී ගැනීම සම්බන්ධව පහත සාමාජිකයින්

ගෙන් සැදුම්ලත් කමිටුව මගින් නිරණ ලබා ගෙන අවශ්‍යතාවයක් ඇති කෘති පමණක් මිලදී ගැනීම පිළිබඳ නිර්දේශය සභා අනුමැතියට යොමු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

01. ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත මැතිතුමා

02.කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා

03.ප්‍රදේශයේ ප්‍රභූ වරයෙක් ( විශ්‍රාම ලත් විදුහල්පතිවරයෙක්, විශ්‍රාමලත් රාජ්‍ය නිලධාරියෙක් හෝ සාමදාන විනිශ්චය කාරවරයෙක්)

04. ප්‍රජා සංවර්ධන නිලධාරි

05. පුස්තකාලාධිපති

06. පුස්තකාල සහායකයින් දෙදෙනෙක් ( පුස්තකාල කිහිපයක් නියෝජනය වන පරිදි)

ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි සියලුම කෘති මිලදී ගැනීම පිළිබඳ සභාවට යොමු කරන්න අවශ්‍ය නැහැ. කමිටුව මගින් අවශ්‍ය කෘති නම් කරලා සභාවට යොමු කරන්න. ඒ සඳහා අනුමැතිය ලබා දෙන්නම්.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා**

ඒක හොඳයි. අපි ඒ විදියට පොත් ගන්න ක්‍රමවේදයක් සකස් කර ගනිමු.

**ගරු ප්‍රා.ස.ම.උප සභාපති එම්. ජයන්ත මැතිතුමා**

අවශ්‍යම කෘති පමණක් තෝරලා ගන්න. එතකොට වියදම් අවම කර ගන්නත් පුළුවන්.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඒ අනුව "පාසල ක්ෂේම භූමියකි" කෘතිය ප්‍රාදේශීය සභාවේ පුස්තකාල හතර සඳහා පිටපත් දෙක බැගින් පිටපත් 8ක් සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු බවත් ඉදිරියේදී පුස්තකාල සඳහා කෘති මිලදී ගැනීම සම්බන්ධව ඒ සඳහා පත් කරන ලද කමිටුව මගින් නිරණය ලබා ගෙන අවශ්‍යතාවයක් ඇති කෘති පමණක් මිලදී ගැනීම පිළිබඳ නිර්දේශය මහා සභා අනුමැතියට යොමු කිරීම සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 2. 2022 වර්ෂය සඳහා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ පැවැත්වීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 වර්ෂයේ ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ පැවැත්වීම මැයෙන් අංක කප්‍රාස 10 හා 2022.05.17 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2022 වර්ෂය සඳහා සභා බල ප්‍රදේශය තුළ

පාසල් ළමුන් සඳහා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ පහත ඇස්තමේන්තුව අනුව සහා අරමුදලින් සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

2022 වර්ෂයේ ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය පැවැත්වීම දළ ඇස්තමේන්තුව

| අනු අංකය | ක්‍රියාකාරකම | ඒකක | ඒකක මිල | අවශ්‍ය ප්‍රමාණය | මුදල |
|---|---|---|---|---|---|
| 01. | ප්‍රශ්ණ පත්‍ර සැකසීම<br>1 ප්‍රශ්ණ පත්‍රය<br>2 ප්‍රශ්ණ පත්‍රය | 02 | 2000.00 | | 4000.00 |
| 02. | මුද්‍රණ කටයුතු<br>1 ප්‍රශ්ණ පත්‍රය<br>2 ප්‍රශ්ණ පත්‍රය | <br>පිටු - 4<br>පිටු - 6 | <br>40.00<br>60.00 | <br>1500<br>1500 | <br>60000.00<br>90000.00 |
| 03. | ලිපි ද්‍රව්‍ය<br>සාමාන්‍ය ෆයිල් කවර<br>භාෆ්ෂීට්<br>පෑන් | <br>01<br>04<br>01 | <br>20.00<br>12.00<br>25.00 | <br>1500<br>1500<br>1500 | <br>3000.00<br>1800.00<br>37500.00 |
| 04. | සම්මන්ත්‍රණය ( ප්‍රශ්ණ පත්‍ර සාකච්ඡාව)<br>1 ප්‍රශ්ණ පත්‍රය ( පෙ.ව.09- පෙ.ව12)<br>2 වන ප්‍රශ්ණ පත්‍රය (ප.ව.01.ප.ව.04 ) | ස්ථාන<br>03<br>03 | <br>5000.00<br>5000.00 | | <br>15000.00<br>15000.00 |
| | එකතුව | | | | 269500.00 |

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා**

මේ වැඩසටහන අපිට වෙන වර්ෂ වල වියදම් වලට සාපේක්ෂව මේ වර්ෂයේ කරන්න බැරිවෙයි. මොකද දැන් සියලු වියදම් වැඩියි. ලිපි ද්‍රව්‍ය පවා මිල ඉහළ ගිහින්. අපි මෙවැනි වැඩසටහනක් සාමාන්‍ය පෙළ සිසුන් සඳහා කරනවා නම් හොඳයි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි මුල් කාලයේ ඉඳලම සෑම වසරකම ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය කළා. ඒ නිසා මේක දිගටම කර ගෙන යමු. අපි වෙන වර්ෂ වල වගේ සිසුන් සඳහා දිවා ආහාරය නොදී ඉඳිමු. එතකොට ලිපි ද්‍රව්‍ය සඳහා යන වියදම් නිලව් කර ගන්න පුළුවන් වෙයි. ඒ නිසා මේ වැඩසටහන සකස් කර ඇති ඇස්තමේන්තුවට අනුව සිදු කරමු.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

දැනට මෙ වැඩසටහන සඳහා ගුරුවරුන් තෝරා ගෙනද ඉන්නේ. දක්ෂ ගුරුවරුන් මේ සඳහා තෝරා ගන්න. අනෙක් කාරණය විදියට මම දකින්නේ සිසුන් ප්‍රමාණය බලලා ඒ අයට ප්‍රමාණවත් පරිදි ලිපි ද්‍රව්‍ය සහ ප්‍රශ්ණ පත්‍ර සකස් කරන්න. එතකොට අපතේ යන ප්‍රමාණය අවම වෙයි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

දැනට ගුරුවරුන් තෝරා ගෙන නැහැ. අපි ප්‍රදේශයේ දක්ෂ ගුරුවරුන් සඳහා අවස්ථාව දෙමු.

ඒ අනුව 2022 වර්ෂය සඳහා සභා බල ප්‍රදේශය තුළ පාසල් ළමුන් සඳහා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය සකස් කරන ලද ඇස්තමේන්තුව අනුව සභා අරමුදලින් සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වාර්තා</u>

### <u>06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කාමිටු වාර්තාව -2022.05.17 වන දින</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022.05.17 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 121 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම සුදුසු බව යෝජනා කරමි.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා විසින් පැමිණ සිටි කමිටු සාමාජිකයින් පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ආරම්භ කරන ලදී.

| අනු අංකය | නාම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | සෙනොක් ට්‍රේඩ් කම්බයින් (පුද්) සමාගම,තල් අරඹ,කඹුරුගමුව,මාතර | ZA-2978 අංක දරන බැකෝ යන්ත්‍රයට අවශ්‍ය oil-seal Axel එකක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 5691.60 |
| 2. | දම්මික ට්‍රේඩ් සෙන්ටර් පුද්ගලික සමාගම,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ආධාරක විදුලි පංකා 04 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 38360.00 |
| 3. | තුෂාර ටයර් සෙන්ටර්,පනාමුර පාර,මිද්දෙනිය | RC-5539 අංක දරන ට්‍රැක්ටරයට 600-16 ප්‍රමාණයේ ටයර් දෙකක් අලුතින් යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 31000.00 |
| 4. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල | 9136.00 |
| 5. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 12600.00 |
| 6. | අයි.ජී.මහින්ද මැතිතුමා,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 11000.00 |
| 7. | එම්.දිනුෂිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 8400.00 |
| 8. | කේ.සී.සංජීව මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 4800.00 |
| 9. | එන්.එන්.වීරක්කොඩි මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 3760.00 |
| 10. | ජී.වී.පී.යමුනා නිල්මිණි මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 6200.00 |
| 11. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 5335.00 |
| 12. | ඩබ්.ආර්.කුමාර මයා, තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 5500.00 |

| | | | |
|---|---|---|---|
| 13. | කේ.ජී.අනුර මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම | 6200.00 |
| 14. | කේ.එරංග රවීෂාන් මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම | 954.00 |
| 15. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 4690.00 |
| 16. | එම්.ගාමිණී මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 6566.00 |
| 17. | කේ.කේ.ජයරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 3426.00 |
| 18. | ධර්මදාස රණතුංග මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 8311.00 |
| 19. | ජී.සමීර මධුසංක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 3144.00 |
| 20. | ජී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 16360.00 |
| 21. | ජේ.කේ.ඒ.ක්‍රිෂාන්ත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 11909.00 |
| 22. | කේ.ටී.එම්.රුවීර ප්‍රියංකර මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 13411.00 |
| 23. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 16406.00 |
| 24. | එස්.ජේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 14222.00 |
| 25. | ආර්.සංජීව මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 3940.00 |
| 26. | ප්‍රියන්ත ඒකනායක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 27. | අයි.ජී.මංජුල මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 6966.00 |
| 28. | බී.දයාසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 2453.00 |
| 29. | සුප්පා වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 9250.00 |
| 30. | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 2284.00 |
| 31. | එම්.ඒ.සුගත් තිලක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 6577.00 |
| 32. | ගයාන් සමන්ත මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 4355.00 |
| 33. | එම්.අමර හේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 13955.00 |
| 34. | රෝහිත ඩිල්ෂාන් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 11022.00 |
| 35. | කේ.කේ.නාලක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 14218.00 |
| 36. | සරත් ලියනගේ මයා, සෞඛ්‍ය කම්කරු , කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 12913.00 |
| 37. | ජේ.එස්.චන්ද්‍රසිරි මයා, මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 15744.00 |
| 38. | සමීර සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 7401.00 |
| 39. | දිමුතු සුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 13837.00 |

| | | | |
|---|---|---|---|
| 40. | කේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 8956.00 |
| 41. | කේ.කේ.ආනන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 3839.00 |
| 42. | කේ.එච්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 7037.00 |
| 43. | ටී.ජී.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 4496.00 |
| 44. | එස්. වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 11468.00 |
| 45. | කුමාර පලිහක්කාර මයා,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 8500.00 |
| 46. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 11676.00 |
| 47. | ජනක පුෂ්පකුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 4647.00 |
| 48. | කේ.කේ.රාමචන්ද්‍ර මයා,ජල වැද්දුම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 2112.00 |
| 49. | ප්‍රභාත් ජානක සම්පත් මයා,ආදේශක මුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 9144.00 |
| 50. | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 4000.00 |
| 51. | කේ.ජී.ටී.හර්ෂණී මිය,තාක්ෂණික සේවා නිලධාරී,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 5500.00 |
| 52. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 5500.00 |
| 53. | ඩබ්.කේ.මංජුලා කුමාරි මෙය,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 1530.00 |
| 54. | ජී.පී.සුනේත්‍රා දමයන්ති මෙය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 2730.00 |
| 55. | ජී.ඒ.විජේසේකර මිය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 3180.00 |
| 56. | එම්.එස්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 4900.00 |
| 57. | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පොළ අධීක්ෂණ දීමනාව | 3000.00 |
| 58. | එම්.කේ.පී.චතුරිකා මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස පොළ අධීක්ෂණ දීමනාව | 3000.00 |
| 59. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 6670.00 |
| 60. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 6227.00 |
| 61. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය සීනි,තේ කොළ හා හකුරු පැකට් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 5000.00 |
| 62. | ඩබ්.ඒ.දනිකා සුභාෂණී මිය,සෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනිය | 2022 මාර්තු මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 6770.00 |
| 63. | මනම්පේරි ස්ටෝර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කිරම බස්නැවතුම්පොළට ජල සැපයුම ලබා දීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 41060.00 |
| 64. | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස්, අංක 33, අබේදොළකැන්න,මාකාවිට,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය විදුලි උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 1015000.00 |

| | | | |
|---|---|---|---|
| 65. | ජේ.ඩිලාන් මයා,චන්ද්‍රා ස්ටෝර්ස්, මීද්දෙනිය පාර,කටුවන | 2022 මාර්තු මස මීද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 8190.00 |
| 66. | ජී.පී.එච්.ප්‍රියන්ත මයා,නෙත්ප්‍රිය බැටරි සෙන්ටර්,මීද්දෙනිය | RD-4364 අංක දරන ට්‍රැක්ටරයට බැටරියක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 22000.00 |
| 67. | තුෂාර ටයර් සෙන්ටර්,පනාමුර පාර,මීද්දෙනිය | RE-8995 අංක දරන ට්‍රැක්ටරයට 600-16 ප්‍රමාණයේ ටයර් යුගලයක් අලුතින් යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 36000.00 |
| 68. | පළාත්භාර අධ්‍යක්ෂ (දකුණ),මාර්ග සංවර්ධන අධිකාරිය,මාතර | 2022.03.14 දින මීද්දෙනිය-හුංගම මාර්ගය දාස හාඩ්වෙයාර් ඉදිරිපිට මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 95438.00 |
| 69. | ඔමාටා පෝම්ස් (පුද්) සමාගම,අංක 91/6,නුගදෙනිය පාර,තලංගම දකුණ,බත්තරමුල්ල | සභාවට අවශ්‍ය ජල බිල්පත් මුද්‍රණය කරවා ගැනීමට අදාලව ගෙවීම් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 138350.00 |
| 70. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 24270.00 |
| 71. | සාමාන්‍යාධිකාරී, සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා හා ගබඩා කිරීම සඳහා 2022.03.16 සිට 2022.03.28 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• 227-5870- ඩීසල්-68L<br>• PF-7414- ඩීසල්-139L<br>• RE-9230-ඩීසල්-111L<br>• RE-9230-එන්ජින් ඔයිල්-30L<br>• BAK-9907- පෙට්‍රල්-20L<br>• MG-330- ඩීසල්-290L<br>• RB-3498- ඩීසල්-75 L<br>• 53-1634- ඩීසල්-130L<br>• ZA -2978-ඩීසල්-130 L<br>• ගබඩාව-පෙට්‍රල්-20L<br>• ගබඩාව- ඩීසල් -140L<br>• 270-0429- ඩීසල්-40 L<br>• 252-6508- ඩීසල්-50 L<br>• RE-8995-ඩීසල්-40L<br>• RC-7796-ඩීසල්-42L<br>• LL-6446-ඩීසල්-90L<br>• RC-5539-ඩීසල්-40L<br>• LL-7399-ඩීසල්-85L<br>• LK-9589-ඩීසල්-70L | 282724.00 |
| 72. | පළාත්භාර අධ්‍යක්ෂ (දකුණ),මාර්ග සංවර්ධන අධිකාරිය,මාතර | මාර්ග පළුදු කිරීම සහා මුදල් ගෙවීම (වලස්මුල්ල කටුවන මීද්දෙනිය මාර්ගයේ මහින්ද නාහිමි මාවත මන්සන්දියේ) | 80981.95 |
| 73. | සාමාන්‍යාධිකාරී, සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා හා ගබඩා කිරීම සඳහා 2022.04.04 සිට 2022.04.08 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• BAK-9907- පෙට්‍රල්-10L<br>• RB-3498- ඩීසල්-39 L<br>• 227-5870- ඩීසල්-53L<br>• RC-7796-ඩීසල්-42L | |

| | | | |
|---|---|---|---|
| | | • RC-5539-ඩීසල්-40L<br>• 53-1634- ඩීසල්-68L.<br>• RC-8995-ඩීසල්-35L<br>• ZA -2978-ඩීසල්-120 L<br>• RE-9230-ඩීසල්-38L<br>• MG-330- ඩීසල්-180L<br>• 252-6508- ඩීසල්-34 L<br>• LL-6446-ඩීසල්-73L | 129612.00 |
| 74. | ආර්.ජී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11394.00 |
| 75. | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11394.00 |
| 76. | කීර්ති අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11394.00 |
| 77. | ජේ.ඒ.රංජිත් කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11394.00 |
| 78. | එම්.ඒ.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 4870.00 |
| 79. | කේ.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 4870.00 |
| 80. | කේ.පී.සංජීව මයා,සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 4000.00 |
| 81. | ලියනාගේ කන්ස්ට්‍රක්ෂන්, E-03, බිංකම, අඟුණුකොළපැලැස්ස | පළාත් නිශ්චිය සංවර්ධන ප්‍රදාන 2021 උලගිරියාව අමුදමන ඇළ මාර්ගයේ පාලම ඉදි කිරීම පළමු කොටසට අදාල ඉතිරි මුදල ගෙවීම | 1204454.86 |
| 82. | සේනක ඉරේෂාන් මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7500.00 |
| 83. | හරිඳු දිනෝෂික මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 12426.00 |
| 84. | ලේකම්,කටුවන ප්‍රාදේශීය සභාව | ජල ගිණුමෙන් පොදු ගිණුමට මුදල් මාරු කිරීම | 500000.00 |
| 85. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්,දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 2022 පළමු කාර්තුව සඳහා මුද්දර බදු මුදල් ප්‍රේෂණය කිරීම. | 20750.00 |
| 86. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව සඳහා ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 100000.00 |
| 87. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත, කිරම | 2022 මාර්තු මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7640.00 |
| 88. | සමරසිංහ මෙටල් ක්‍රෂර්ස්, තලාව, කාරියමඩිත්ත | කටුවන මහජන පොළ භූමියෙහි කොන්ක්‍රීට් ගල් කියුබ් 2.7 ක ප්‍රමාණයක් ඇතිරීමට මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 20250.00 |
| 89. | රෝහිණී අබේනායක මිය,කටුවන පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 මාර්තු මස 24 වන දින පැවති මහා සභාවට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම කිරීම<br>• චිකන් රයිස් 40-රු 18400.00<br>• රෝල්ස් 80-රු4800.00<br>• කෙසෙල් ගෙඩි 40-රු1600.00<br>• වීස් 40-රු1920.00 | |

| | | | |
|---|---|---|---|
| | | • ගස් කජු 1 kg -රු7000.00<br>• ක්‍රීම් ක්‍රැකර් පැකට් 02-රු560.00<br>• සර්වියට් පේපර් පැකට් 02-රු280.00<br>• වතුර බෝතල් 40-රු2400.00 | 36960.00 |
| 90. | සහන් චතුරංග මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 8043.00 |
| 91. | එම්.එස්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 1719.00 |
| 92. | තරිඳු දිනේෂික මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 3850.00 |
| 93. | ඩබ්.සුභාෂණී මිය,සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් | 4800.00 |
| 94. | කේ.එස්.එස්.පී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | ZA-2978 බැකෝ යන්ත්‍රය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් | 41325.00 |
| 95. | විජිත සර්විස් සෙන්ටර්, කටුවන පාර,මිද්දෙනිය | RE-9230 ට්‍රැක්ටරය වාර සේවා කිරීම වෙනුවෙන් | 31195.00 |
| 96. | වීරසිංහ හාඩ්වෙයාර්,අංක79,මහ විදිය, අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ජල මීටර් 250 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 1643750.00 |
| 97. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 5815.00 |
| 98. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 2553.00 |
| 99. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | රට තුළ පැවති අර්බුදකාරී තත්වය මත ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා ඉන්ධන මිලදී ගැනීමට ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 30320.00 |
| 100 | මෙට්‍රෝ කම්පියුටර් ටෙක්නොලජී,නො 02,කාලිදාස පාර,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ටෝනර් ඇතුළු ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 289400.00 |
| 101 | එල්.ඩී.ඩී.සම්පත් මයා,සසඳි මල්ටි කලෙක්ෂන්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම<br>• කැෂියර් මේස 07-රු 111300.00<br>• කැරකෙන පුටු 12-රු156000.00<br>• කම්පියුටර් ටේබල් 02-රු13600.00<br>• පාර්ශෝගික පුටු 06-රු78600.00 | 359500.00 |
| 102 | බී.නිමාලි පෙරේරා මිය,53/06/2,ප්‍රිය සෙවන,මකුළුදූව,පිළියන්දල | "කඳු අතර දියවල" කෘතිය පිටපත් 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 2880.00 |
| 103 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 9320.00 |
| 104 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,හම්බන්තොට | කටුවන පොදු වෙළඳපළ ආපනශාලාවේ බදු අයිතිය ලබා ගෙන සිටි ජී.කුසුමාවතී මිය විසින් 2022/12/07 දින 6416 අංක දරන ලදුපතින් ගෙවා ඇති 25% ආරක්ෂිත ඇප තැන්පත් මුදලින් 2022 ජනවාරි මසට අදාලව අය විය යුතු ඉතිරි හිග ජල මුදල හා 2022 පෙබරවාරි/මාර්තු මාසවලට අදාල ජල බිල්පත් ප්‍රාදේශීය සභා අරමුදලින් අය කර යැවීම | 9770.87 |
| 105 | කේ.ජී අනුර මයා,සංවර්ධන නිළධාරි,කටුවන ප්‍රදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5512.00 |

| | | | |
|---|---|---|---|
| 106 | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 107 | එම්.කේ.පී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3880.00 |
| 108 | ශක්ති එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්,ඔරලෝසු කණුව අසල,පල්ලේගම,ඇඹිලිපිටිය | කටුවන ප්‍රදේශීය සභාවේ ජල ව්‍යාපෘතියට අවශ්‍ය vista foxtam liquid level relay මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 11500.00 |
| 109 | ගයා ප්‍රින්ට් ශොප්,හුංගම පාර,මිද්දෙනිය | සභාවට අවශ්‍ය ලිපි ශීර්ෂ පොත් 50 ක් හා ෆයිල් කවර 2100 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 109200.00 |
| 110 | ඩබ්.ඒ.දනිකා සුභාෂණී මිය,සෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනිය | 2022 අප්‍රේල් මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 4910.00 |
| 111 | වජිර නාරම්පනාව මයා,163/21,විමුක්ති මාවත,පිටවුගල,මාලබේ | බෞද්ධ රාජ්‍ය පරිපාලන මූලධර්ම සහ භාවිතය නම් කෘතියේ පිටපත් 04 ක් ලබා ගැනීම | 3400.00 |
| 112 | ජේ.ඒ.තිලකරත්න මයා,40,බෞද්ධාලෝක මාවත,පිළියන්දල | ලංකා සිවිල් සේවය නම් කෘතියේ පිටපත් 05 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 4500.00 |
| 113 | ටී.ජී.අයි.බී.මුණසිංහ මයා,14/5,සමන් උයන,දඹගේන පාර,මහරගම | පුස්තකාල සඳහා උඳුවප් මාසයේ බෞද්ධාගමික වැදගත්කම කෘතියේ පොත් 08 ක් සහ බිනර මාසයේ බෞද්ධාගමික වැදගත්කම කෘතියේ පොත් 08 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 3072.00 |
| 114 | රත්නායක ටයර් සෙන්ටර්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | Bak-9907 අංක දරන යතුරුපැදියට 300/17 ප්‍රමාණයේ ටයර් එකක් අලුතින් යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 5600.00 |
| 115 | එම්.පී.අමරසේන මයා,ජල සහයක,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ජල බිල්පත් බෙදා අවසන් කිරීම වෙනුවෙන් ලබා දෙන ඉන්ධන දීමනාව ගෙවීම | 1000.00 |
| 116 | ඩබ්.ඒ.වසන්ත කුමාර මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ජල බිල්පත් බෙදා අවසන් කිරීම වෙනුවෙන් ලබා දෙන ඉන්ධන දීමනාව ගෙවීම | 1000.00 |
| 117 | එච්.ඒ.චමින්ද වික්‍රමසිංහ මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම | 3271.00 |
| 118 | අමිල සම්පත් මයා,සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 4294.00 |
| 119 | එම්.දිනුජිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 120 | ජේ.එස්.නිශාන්ත මයා, එස්.අයි.එම්.එස්.කන්ස්ට්‍රක්ෂන්, වික්‍රම, තිස්ස පාර,අම්පාර | කටුවන ප්‍රාදේශීය සභාවේ අඹවත්ත ජල ව්‍යාපෘතියේ පවිත්‍රතා කටයුතු සඳහා අවශ්‍ය වැලි කියුබ් 39 ක් ලබා ගැනීම වෙන්වෙන් ගෙවීම් කිරීම | 546000.00 |
| 121 | ලසිකා නිල්මිණී රණමුඛ මිය,කිරම බත් කඩේ,වරාපිටිය පාර,කිරම | කිරම බස් නැවතුම්පල විවෘත කිරීමේ පූර්ව සූදානම් කටයුතුවලට 2022.02.23, 2022.02.25,2022.02.26 දිනවල සහභාගී වූ බාහිර පුද්ගලයින්ට සංග්‍රහ කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 26000.00 |

ඉහත වවුචර් අංක 01 සිට 121 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) රට තුළ පවතින ඉන්ධන අර්බුදය තවදුරටත් ඉදිරියට පැවතුනහොත් පිරවුම්හලින් ඉන්ධන ලබා ගත හැකි අවස්ථාවන්වලදී කටුවන ප්‍රාදේශීය සභාවේ ගබඩාව වෙත ලබාගෙන සංචිතයක් වශයෙන් පවත්වාගෙන අවශ්‍ය අවස්ථාවන් වලදී වාහන වෙත නිකුත් කිරීම තවදුරටත් සිදු කිරීම සුදුසු බව යෝජනා විය.

ගරු ප්‍රා.ස.මි. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව අංක 01 සිට 149 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01හි සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 අප්‍රේල් මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 වර්ෂයේ අප්‍රේල් මස මහ සභාව සතු සියළු වෙළඳ පොලවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.536790.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 61844.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.474946.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මි. ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 අප්‍රේල් මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 අප්‍රේල් මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 අප්‍රේල් මස වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:139250.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,රියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු: 359818.60 ක වියදමක් දරා ඇත. එමෙන්ම මෙම යන්ත්‍රෝපකරණ මගින් රු: 220568.60ක අලාභයක් ලබා ඇත.

ගරු ප්‍රා.ස.මි. ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස. මි ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

මෝටර් ග්‍රේඩරය වැඩකට යන්නේ නැහැ නේද?. ඩීසල් ප්‍රශ්නය තමයි හේතුව වෙන්න ඇත්තේ. අපේ සභාව සතුව තෙල් සංචිතයක් තියනවද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, තෙල් ටිකක් තියෙනවා. මොකද අපි කසළ ඉවත් කිරීම අනිවාර්යෙන්ම කරන්න ඕන. ට්‍රැක්ටර් වලට තෙල් ටික ගහන්න ඕන. ඊට අමතරව වෑන් එක අපේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන පහසුකම් අවශ්‍ය අවස්ථා වල යවනවා. කළු කැබ් රථය වත් පසුගිය කාලය තුළ විශාල දුරක් ගියේ නැහැ. වාහන පුළුවන් තරම් අවමයෙන් තමයි භාවිතා කරන්නේ.

ඒ අනුව 2022 අප්‍රේල් මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 අප්‍රේල්

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා අප්‍රේල් මස රු.755743.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 අප්‍රේල් මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොමැති බැවින් සියලූ මන්ත්‍රීතුමන්ලාගේ ඒකඟතාවය මත සභා සම්මත කරන ලදී.

## 07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 16 වාර්ථා

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස 16 ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
  2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
  3. 0072633606- කර්මාන්ත ගිණුම
  4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
  5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
  6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 පෙබරවාරි මස ප්‍රා.ස. 16 වාර්තා

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 අප්‍රේල් මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස.16 වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08. වෙනත් යෝජනා

### 08-1. සපුතන්ත්‍රිකන්ද පොදු සුසාන භූමිය මැනුම් කර පවරා දීම සම්බන්ධවයි.

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

සපුතන්ත්‍රිකන්ද පොදු සුසාන භූමිය මැනුම් කර පවරා දීම සම්බන්ධවයි මැයෙන් කටුවන ප්‍රාදේශීය ලේකම්ගේ අංක DSWA/LND/6/561/CMTRY/F1/03 හා 2022.05.17 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි අ.ග.පි. 51 කැබලි අංක 189 හි අක්.02 පර්.04 ක් වූ ඉඩම සපුතන්ත්‍රිකන්ද පොදු සුසාන භූමියට වෙන් කර ඇති අතර ඉන් පර්චස් 20ක් සපුතන්ත්‍රිකන්ද පෙර පාසල් ගොඩනැගිල්ල සකස් කිරීම සඳහාද තවත් පර්චස් 20ක් කොට්ඨාශයෙහි සේවය කරන රජයේ නිළධාරීන් සඳහා සේවා පියසක් ඉදිකිරීමට ද ඉතිරි ප්‍රමාණය පොදු සුසාන භූමිය සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමටද තීරණය කර ඇති බව දන්වා ඇත. ඒ අනුව ඒ සඳහා ඒකඟතාවය ලබා දෙන බවට දන්වා යැවීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

අපි මේ සඳහා අනුමැතිය ලබා දෙමු. මේ ප්‍රදේශයේ දැනටත් මිනිස්සු වගා කටයුතු එහෙම කරලා තියෙන්නේ . නමුත් ඉතින් රජයට අයත් ඉඩම් නිසා ප්‍රාදේශීය ලේකම් අවශ්‍ය කටයුතු කරලා පවරා ගැනීම් කරාවී.

<u>ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත මැතිතුමා.</u>

මේ ඉඩම් වල වගා කටයුතු කළත් ඉදිකිරීම් කරලා නැහැ. පවරා ගැනීමේදී යම් යම් ගැටළු ඇතිවෙන්න පුළුවන්. නමුත් මේ කාර්යය කරන්න වෙනවා.

ඒ අනුව අ.ග.සි. 51 කැබලි අංක 189 හි අක්.02 පර්.04 ක් වූ ඉඩම යපුතන්ත්‍රිකන්ද පොදු සුසාන භූමියට වෙන් කර ඇති අතර ඉන් පර්චස් 20ක් සපුතන්ත්‍රිකන්ද පෙර පාසල් ගොඩනැගිල්ල සකස් කිරීම සඳහාද තවත් පර්චස් 20ක් කොට්ඨාශයෙහි සේවය කරන රජයේ නිළධාරීන් සඳහා සේවා පියසක් ඉදිකිරීමට ද ඉතිරි ප්‍රමාණය පොදු සුසාන භූමිය සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමටද තීරණය කර ඇති බැවින් ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ එකගතාවය ලබා දෙන බවට දන්වා යැවීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-2. සභාව සතු ගල් රෝල සහ ටිපර් රථය කුලියට ගෙන යාම වෙනුවෙන් සහනයක් ලබා ගැනීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

2022.04.27 දිනැති ලිපිය සම්බන්ධවයි මැයෙන් අංක 01, සිළුමිණිගම, ඇඹිලිපිටිය ලිපිනයෙහි පදිංචි ඩබ්.ඕ. කරුණාසේන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාවට අයත් ගල් රෝල හා ටිපර් රථය කුලී පදනම් මත ලබා ගෙන දින කිහිපයක් වැඩ කළද වර්ෂාව හේතුවෙන් වැඩ කර ගත නොහැකිව නැවත ගෙනවිත් ඇත. මේ සඳහා ඔහු විසින් ගෙවිය යුතු කුලිය සම්බන්ධයෙන් සහනයක් ඉල්ලා ඇති අතර මෙම වාහන සඳහා වැඩිපුර ගෙවා ඇති මුදල් වලින් අදාළ ගාස්තු අය කර ගැනීම සුදුසු බවත් වැඩ නොකර වාහන නතර කර තිබූ කාලය සඳහා ගාස්තු අය නොකිරීම සුදුසු බවත් ඒ බව විගණන කළමණාකරණ කමිටුව සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ජී. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

අපේ සභාවට අයත් රෝල සහ ටිපර් රථය හැටන් ප්‍රදේශයේ පාරක් කැපීම සඳහා කුලියට ලබා දුන්නා. නමුත් වර්ෂාව හේතුවෙන් ඒ කාර්යය කර ගැනීමට බැරිව වාහන නතර කරන්න වුණා. අපේ රියදුරු මහතුන් වාහන නතර කරලා නැවත පැමිණියා. ඒ අයගේ දෛනික ධාවන සටහන් වල ඒ බව සටහන් වෙනවා. මෙතනදී මතුවන ගැටළුව වන්නේ අපි රෝල නතර කරන කාලයටත් අය කිරීම කරනවා. නමුත් මේ පුද්ගලයා ඒ සඳහා සහනයක් ඉල්ලා සිටිනවා. වාහන නතර කළ කාලයට ගෙවීම කරන්න අපහසුයි කියලා. මේ වාහන ගෙනියද්දි සභාවට සල්ලි බැඳලා තමයි ගෙනිහින් තියෙන්නේ. දැනට වැඩ කරපු කාලයට ඒ මුදල් හිලව් කරන්න කියලා තමයි ඉල්ලීම කරන්නේ.

<u>ගරු ප්‍රා.ස.ම ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>

මේ පෞද්ගලික කාර්යයක් සඳහාද ගෙනිහින් තියෙන්නේ. අපේ වාහන ඔපරේටර් වරුන් මෙහේ හිටියා නම් වාහන ධාවනය කරලා නැහැනේ. ඒ සම්බන්ධයෙන් වාහන සටහන් පොත් පරීක්ෂා කරලා සහනයක් දෙනවා නම් හොඳයි. අපේ රියදුරු මහතුන් මෙහේ හිටියා නම් නතර කරපු කාලයට අය කිරීම තුළ සාධාරණයක් නැහැ.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

පෞද්ගලික කාර්යයක් සඳහා තමයි වාහන කුලියට ගත්තේ. මේ සම්බන්ධව විගණන කළමණාකරණ කමිටුවේදී කතා කළා. අපි මේ සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් පොත් ආදිය පරීක්ෂා කරලා සහනයක් ලබා දෙමු. ඒ සම්බන්දව විගණන කළමණාකරණ කමිටුව දැනුවත් කරමු.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාවට අයත් ගල් රෝල හා ටිපර් රථය කුලී පදනම මත ලබා ගෙන දින කිහිපයක් වැඩ කළද වර්ෂාව හේතුවෙන් වැඩ කර ගත නොහැකි වූ හෙයින් මේ සඳහා ඩබ්.ඕ.කරුණාසේන මහතා විසින් ගෙවිය යුතු කුලිය සම්බන්ධයෙන් සහනයක් ඉල්ලා ඇති අතර මෙම වාහන සඳහා දැනට ගෙවා ඇති මුදල් වලින් අදාළ ගාස්තු අය කර ගැනීම සුදුසු බවත් වැඩ නොකර වාහන නතර කර තිබූ කාලය සඳහා ගාස්තු අය නොකිරීම සම්බන්ධවත්, මේ සම්බන්ධයෙන් විගණන කළමණාකරණ කමිටුව දැනුවත් කිරීම සම්බන්ධවත් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-3 බැකෝ යන්ත්‍රයේ සිදුවන ධාවන අලුත්වැඩියා සඳහා ගෙවීම කිරීමට අනුමැතිය ලබා ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

බැකෝ යන්ත්‍රයේ සිදුවන ධාවන අලුත් වැඩියා සඳහා ගෙවීම කිරීමට අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස /18/වාහන හා 2022.05.19 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභාව සතු ZA – 2978 අංක දරණ බැකෝ යන්ත්‍රයෙහි ධාවන අලුත්වැඩියාවන් වන හයිඩ්‍රොලික් හෝස් පුපුරා යාමෙන් ඇති වන අලුත්වැඩියාවන් සිදු කිරීමේදී රු.5000.00 ඉක්මවන සුළු අලූත්වැඩියාවන් සඳහාද මිල කැඳවීම කර සිදු කිරීම ප්‍රායෝගික නොවන බැවින් තාක්ෂණ නිළධාරි නිර්දේශය මත එම අලූත්වැඩියාවන් සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මේ දිනවල භාණ්ඩ මිල ඉහළ යාමත් සමග මෙවැනි කාර්යයන් සඳහා රු. 5000.00ට වඩා වැඩි වියදමක් යනවා. නමුත් මිල කැඳවීම් කරලා කාලයක් ගත වන තුරු මේ අලූත්වැඩියාවන් පරක්කු කරන්න බැහැ. ඒ නිසා තමයි තාක්ෂණ නිළධාරි නිර්දේශය මත අලූත්වැඩියා කටයුතු සිදු කරන්න අනුමැතිය ඉල්ලා සිටින්නේ.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාව සතු ZA – 2978 අංක දරණ බැකෝ යන්ත්‍රයෙහි ධාවන අලූත්වැඩියාවන් වන හයිඩ්‍රොලික් හෝස් පුපුරා යාමෙන් ඇති වන රු. 5000.00 ඉක්මවන සුළු අලූත්වැඩියාවන් සිදු කිරීමේදී මිල කැඳවීම කර සිදු කිරීම කාලයක් ගත වන බැවින් තාක්ෂණ නිළධාරි නිර්දේශය මත එම අලූත්වැඩියාවන් සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08- 4 .කටුවන පොළෙහි මාළු පොළෙන් අප ජලය බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කටුවන පොළෙහි මාළු පොළෙන් අප ජලය බැහැර කිරීම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීම හා මාළු පොළ බිම කොටස කොන්ක්‍රීට් කිරීම මැයෙන් අංක කප්‍රාස 09 හා 2022.05.20 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන පොළෙහි මාළු අලෙවි කරනු ලබන ස්ථානයේ අප ජලය බැහැර කිරීම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීම හා බිම කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා සභා අරමුදල් යොදවා ක්ෂණිකව සිදු කිරීම සුදුසු බවත් කොන්ත්‍රාත් ලබා දීමකින් තොරව සෘජු ශ්‍රම පදනමින් සිදු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු ප්‍රා.ස. ම යූ.ජී.ධර්මසිරි මැතිතුමා.</u>**

කටුවන පොළේ මේ කටයුත්ත කරන්න ඕන. ඒක ලොකු ප්‍රශ්නයක් ඒ පැත්තට යන්නත් බෑ.ඒකට ඉක්මණින් විසඳුමක් ලබා දෙන්න වෙනවා. ඒත් එක්කම දෙවට පාර සකස් කරන්න ඕන. ඒ සඳහා පොලිසියේ ආරක්ෂාව මත හරි මේ කාර්යය කරන්න ඕන. සභාවේ මැෂින් දාලා , සේවකයින් යොදවලා කරමු.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මේ වගේ ගැටළු තියන ප්‍රතිපාදන මගින් විසදන්න වෙනවා. ඒ නිසා කටුවන පොළේ ප්‍රශ්නය සහ කඩ කාමර සකස් කරලා දෙන්න කඩිනමින් කටයුතු කරමු. ඒ සඳහා අවශ්‍ය උපදෙස් පළාත් පාලන සහකාර කොමසාරිස් තුමියගෙන් ලබා ගනිමු.

ඒ අනුව කටුවන පොළෙහි මාළු අලෙවි කරනු ලබන ස්ථානයේ අප ජලය බැහැර කිරීම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීම හා මාළු පොළ බිම කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා සභා අරමුදල් යොදවා කඩිනමින් සිදු කිරීම සම්බන්ධවත් එය කොන්ත්‍රාත් ලබා දීමකින් තොරව සෘජු ශ්‍රම පදනමින් සිදු කිරීම සම්බන්ධවත් විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-5. වවුචර් සදහා ගෙවීම් කිරීම</u>

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් කඩිනමින් ගෙවිය යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම යුදුසු යයි යෝජනා කරමි.

01.වවුචර් අංක 403 - මැල්ලකැටිගොඩ ගොවි සංවිධානය, මිද්දෙනිය - මිද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම කොටස කොන්ක්‍රීට් කිරීම සහ වැසිකිළිය අලුත්වැඩියාව - මුළු මුදල රු. 494447.73 ( 10% රැදවුම- රු. 49444.77 + ගෙවන මුදල රු. 445002.96)

02. වවුචර් අංක 387 - සාමාන්‍යාධිකාරි, සී.ස.වි සේවා සමුපාකාර සමිතිය - 2022.04.09 සිට 2022.04.30 දක්වා ඉන්ධන ලබා ගැනීම - රු.626131.00

03. වවුචර් අංක 380- මුදල් භාරකරු - කටුවන ප්‍රාදේශිය සභාව සතු වාහන සදහා ආදායම් බලපත්‍ර සහ දූම සහතික ලබා ගැනීම සදහා අත්තිකාරම් ලබා ගැනිම- රු.20000.00

04. වවුචර් අංක 392 - ශක්ති සුභ සාධක සමිතිය- මහින්ද නාහිමි මාවත, හෙල්ලල ජන සවි මාවතේ නුවන් මහතාගේ නිවස අසළ සිට තෙර්රකොළයාය ,මායිම දක්වා සකස් කිරීම , 10% රැදවුම් මුදල් නිදහස් කිරීම - රු. 24833.75

05.වවුචර් අංක -පුබුදු ගොවි සංවිධානය, මිද්දෙනිය උතුර මුකලන් හේන මාර්ගය ප්‍රතිශංස්කරණය - බිල්පත් මුදල - රු 249625.80 ( 10% රැදවුම- රු. 24962.58+ ගෙවන මුදල රු. 224663.22)

06. වවුචර් අංක 386 - පුබුදු ගොවි සංවිධානය අංක 554, පහලවත්ත, ඇල ඉවුර , පහළවත්ත මාර්ගය ප්‍රතිශංස්කරණය කිරීම - බිල්පත් මුදල - රු. 249912.67 (10% රැදවුම - රු.24991.26 + ගෙවන මුදල - රු. 224921.41)

07.වවුචර් අංක - පුබුදු ගොවි සංවිධානය, හොරේ වෙල , වලස්මුල්ල - හොරේවෙල ගොරක මුදුන පාර- බිලපත් මුදල රු. 249333.84 ( 10% රඳවුම- රු. 24933.38 + ගෙවන මුදල රු. 224400.46)

08.වවුචර් අංක 75 - ඊ. සුසන්ත නිලන්ත මෝටර්ස්, මිද්දෙනිය පාර, වල්ගම්මුල්ල - LK 9589 ටිපර් රථයේ සිදු කරන ලද අලුත් වැඩියාව සඳහා - රු. 77500.00

09.වවුචර් අංක 74 - ඊ. සුසන්ත නිලන්ත මෝටර්ස්, මිද්දෙනිය පාර, වල්ගම්මුල්ල - 227-5163 ජල බවුසරය සිදු කරන ලද අලුත් වැඩියාව සඳහා - රු. 18800.00

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් කඩිනමින් ගෙවීම කළ යුතු බැවින් එම වවුචර් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-06. පාසල් නිවාඩු කාලය තුළ පෙර පාසල් පැවැත්වීම සම්බන්ධවයි

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

පාසල් නිවාඩු කාලය තුළ පෙර පාසල් පැවැත්වීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 10 හා 2022.05.24 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව රජයේ පාසල් නිවාඩු දී ඇති බැවින් ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල්ද ඊට සමගාමීව නිවාඩු දීම සිදු කළද වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයෙන් දුරකථනයෙන් දැනුම් දී ඇති පරිදි නිවාඩු කාලය තුළත් පෙර පාසල් පැවැත්වීම සුදුසු බවත් ප්‍රාදේශීය සභා පෙර පාසල් අධීක්ෂණය සඳහා ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා පත් කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී රමණී හල්පෙගමගේ මැතිතුමිය යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි පාසල් ආරම්භය සහ නිවාඩු ලබා දීම අනුව ප්‍රාදේශීය සභා පෙර පාසල්ද ඊට සමගාමීව කටයුතු කරන්න කමයි චක්‍රලේඛ වලට අනුව තියෙන්නේ. නමුත් සභාවේ තීරණයක් අරගෙන අපි පාසල් නිවාඩු ලබා දුන්නත් පෞද්ගලික පෙර පාසල් පවත්වන නිසා අපේ ළමයින් සඳහාත් පෙර පාසල් පවත්වමු. කොහොමත් අපි ඒ අයට වැටුප් ගෙවනවා. ඒ සඳහා වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයෙන් අපිට අනුමැතියක් ලැබිලා තියෙනවා.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා.**

කොරෝනා වසංගත කාලය තුළත් අපි පෙර පාසල් වසා තැබුවා. එහෙම වෙද්දි ළමයින්ට අධ්‍යාපනය ලබන්න තියන අවස්ථාව අඩු වෙනවා. පෞද්ගලික පෙර පාසල් පවත්වනවානේ. පාසල් නිවාඩුව අදාළ කර නොගෙන අපිත් පෙර පාසල් පවත්වමු.

**ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා.**

ගරු සභාපතිතුමණි, පාසල් නිවාඩු දුන්නත් අපිට සභා තීරණයක් මගින් සභා පෙර පාසල් පවත්වන්න පුළුවන් නේද?

**ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා.**

මේ පෙර පාසල් වල ගැටළු පිළිබඳ අධීක්ෂණය කරන්න කෙනෙක් පත් කරනවා නම් හොදයි. ඒ අයගේ ගැටළු පිළිබඳ සාකච්ඡා කරලා සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ඒ සදහා සියලුම ක්ෂේත්‍ර ගැන අවබෝධයක් තියන කෙනෙක් ලෙසත් , ගුරුවරයෙක් ලෙසත් කටයුතු කරන නිසා ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමන්ව මම යෝජනා කරනවා.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා.**

එතුමා ඒ සදහා සුදුසුයි. මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව ප්‍රාදේශීය සභාවට අයත් පෙර දැනට පවතින පාසල් නිවාඩු කාලය තුළ පැවැත්වීම සුදුසු බවත් ප්‍රාදේශීය සභා පෙර පාසල් අධීක්ෂණය සදහා ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා පත් කිරීම සුදුසු බවත් සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-07. සම්පත් උයන පණුගල් ආර මාර්ගයේ කාණු පද්ධතිය ගොඩ දැමීම සම්බන්ධවයි.**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

සම්පත් උයන පණුගල් ආර මාර්ගයේ කාණු පද්ධතිය ගොඩ දැමීම සම්බන්ධවයි මැයෙන් ඌරුබොක්කේ ගෙදර, පණුගල්ආර, වීරක්කුට්ටිගොඩ, කටුවන ලිපිනයෙහි පදිංචි වයි. නිශාන්ත යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව එම මාර්ගයේ කාණුව යම ස්ථානයකින් ගොඩ කිරීම හේතුවෙන් පාර හරහා වතුර ගලා බැසීම නිසා මාර්ගයේද වළවල් හැරී යා නොහැකි තත්වයක් ඇති වන බව දන්වා ඇත. මේ ස්ථානය තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත සභාවේ යන්ත්‍ර සූත්‍ර මගින් පිළිසකර කර දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී යූ.ජී.ධර්මසිරි මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී. මෙ ස්ථානය අපේ මැෂින් එක දාලා කාණුව පාදා දෙන්න.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි ඒ පැත්තට මැෂින් ගෙනියන වෙලාවට මේ ස්ථානය බලලා සකස් කරලා දෙන්නම්.

ඒ අනුව සම්පත් උයන පණුගල් ආර මාර්ගයේ කාණු පද්ධතිය යම ස්ථානයකින් ගොඩ කිරීම හේතුවෙන් පාර හරහා වතුර ගලා බැසීම නිසා මාර්ගයේද වළවල් හැරී යා නොහැකි තත්වයක් ඇති වී ඇති බැවින් මේ ස්ථානය තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත සභාවේ යන්ත්‍ර සූත්‍ර මගින් පිළිසකර කර දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-08. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. එන්.ඒ.එස්.වීරසිරි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-09. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම කේ.රන්ජන් වීරසේකර මැතිතුමා**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-10. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ඩබ්.ඒ.සංජීව මැතිතුමා**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ.සංජීව මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමාට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-11. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස් ගුණවර්ධන මැතිතුමිය ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ඊ.බී.ඉන්දික මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**09.ප්‍රගතිය සාකච්ඡා කිරීම**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ජී. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මිද්දෙනිය රණවිරු උයන ඇවිදින මංතීරුව පසුගිය දිනවල වර්ෂාව නිසා කඩා වැටිලා . එය ඉක්මණින් පිළිසකර කිරීමට අවශ්‍යයි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ඔව්.මම ඒ අයත් සමග ඒ ගැන කථා කළා. ඒ අයම ඒක පිළිසකර කරන බව කිව්වා.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ජී. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා**

ඒ සදහා අපේ මැෂින් ලබා දීලා අවශ්‍ය සහයෝගය ලබා දෙමු.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ඒක ගැටළුවක් නැහැ. ඉල්ලන ඕනෑම සහයෝගයක් අපි ලබා දෙමු.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

ඒ අය ඒක සකස් කරලා දෙනවා නම් ලොකු දෙයක් . නැත්නම් අපිට විශාල මුදලක් දරන්න වෙනවා.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කිරම බස් නැවතුම්පොළ කඩ කාමර ලබා දෙද්දී කිහිප දෙනෙකුට කඩ කාමර සකස් කරලා දෙන්නත් කිව්වානෙ. ඒ කඩ කාමර ඉක්මණින් සකස් කරනවද?

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

දැනට ඒ සඳහා ඇස්තමේන්තු සකස් කරලා ඒවා අනුමැතිය සඳහා හම්බන්තොට යවලා තියෙනවා. අපි ඒ අයට පොරොන්දු වෙච්ච විදියට ඉක්මණින් පුළුවන් ක්‍රම වේදයකට සකස් කරලා දෙන්න තමයි ඉන්නේ.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, රටේ පවතින තත්වය අනුව සහ දේශපාලන වාතාවරණය තුළ දේශපාලන අධිකාරියේ පහළම පරිපාලනමය අංශය හැටියට ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන අපට විශාල වගකීම් කොටසක් පැවරෙනවා. කෙසේ නමුත් අද වන විට සභාව තුළ කොහොම කථා කළත් අපට ජනතාව අතර නැගී සිටීමට නොහැකි තත්වයක් අද වන විට උදාවෙලා තියෙනවා. පසුගිය දිනවල කොළඹ ඇති වූ අරගලකාරි සිද්ධි සම්බන්ධයෙන් කථා කරද්දි ප්‍රශ්න ගැටළු හමුවේ අපි මහ ජනතාවගේ නැගී සිටීමත් එක්ක ඒ අයගේ බලය පිළිගන්නවා. ඒ බලය අනික්‍රමණය කරමින් අපි මොන රැකියාවක , මොන ආයතනයක, මොන තරාතිරමක හිටියත් අපිටත් ඒ අයට වගේම මේ ගැටළු වලට මුහුණ දෙන්න වෙනවා. අපිටත් ඉන්ධන පිරවුම් හලක තෙල් ටිකක් හෝ ලබා ගැනිමට හැකියාවක් නැහැ. සාමාන්‍ය මහ ජනතාව වගේම අපිත් පෝළිම් වල සිටිමින් ඒ අසීරුතා විදිය යුතු බව තමයි මිනිසුන්ගේ මතය. ඒ පිරිහීමේ ලක්ෂණය ඉහළ දේශපාලන අධිකාරිය තුළ ජනාධිපතිතුමන් , අගමැතිතුමන් සිට පහල තලය දක්වාත් සියලුම නිළධාරින් දක්වාත් පැතිරිලා තියෙනවා. අපි මොන සේවාවන් කළත් එක් අඩුපාඩුවක් වුණාම ඒක ලොකුවට කථා කරනවා.

අපි සභාවක් විදියට ජනතාව වෙනුවෙන් මුදල් වියදම් කරලා විශාල සේවාවක් කරනවා. නමුත් දැනට මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව වියදම් පාලනය කළ යුතු සීමාවන් නිරීක්ෂණය කළාම අපිට වියදම් කළ යුතු අවකාශය ඉතා අඩුයි. අත්‍යවශ්‍යම , සාධාරණ හේතුවකට පමණක් අපේ සභා අරමුදල් යොදවන්න වෙනවා. ගරු සභාපතිතුමා ඒ අත්‍යවශ්‍යම කාරණා හඳුනා ගෙන ඒ අනුව කටයුතු කරාවි යයි බලාපොරොත්තු වෙනවා.

ඒත් එක්කම මම දැන ගැනීමට කැමතියි අයථා ජල සම්බන්ධතා හේතුවෙන් නැවත ජල සම්බන්ධතාවය ලබාදිම සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන්. කෙසේ නමුත් සියලු දෙනාටම සාධාරණයක් වෙන විදියට ඇතැම් සම්බන්ධතා මත එවැනි දඩ නිදහස් කිරීම වැනි දේවල් නොකර සමාන පරිදි මෙම දඩ මුදල් හා අය කිරීම කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමන් ඇතුළු සහෝදර මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලීමක් සිදු කරන්න තියෙනවා. අපේ ධූර කාලය වසරකින් දීර්ඝ කරලා තිබුණත් තව කොපමණ කාලයක් මේ සභාව තුළ කටයුතු කරන්න වෙයිද දන්නේ නැහැ. රජය විසින් ගන්නා යම් තීන්දු තීරණ එක්ක අපිට අවනත වෙන්න වෙනවා. කෙසේ නමුත් අපි සභාව තුළ සිටියත් නැතත් අපිට ගමේ ජනතාව සමග ගොඩනගා ගත් සම්බන්ධතාවයත් සමග ඒ වටිනාකම රැකගෙන කටයුතු කරමින් ඉදිරියේදී යම් යම් කරුණු කාරණා වලදී ප්‍රාදේශීය සභාව සමගත් අවශ්‍ය කටයුතු කිරීමට සියලු දෙනාම සහයෝගයෙන් යුතුව එකතු වෙමුයි කියමින් මගේ කථාව අවසන් කරනවා. සියලු දෙනාටම ස්තුතියි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී සුගත් සරබගේ මැතිතුමා**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. අද වන විට රටේ විශාල මූල්‍ය අර්බුධයක් හමුවේ ආර්ථික අපහසුතා පවතින කාල වකවානුවක ඒ සියල්ල දේශපාලන බලපෑම් වලට ලක් වූ අවස්ථාවක තමයි අපි මේ කාලය ගතකරන්නේ. එහිදී අතිගරු ජනාධිපති තුමන් සිට ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රිවරයා දක්වාම , පක්ෂයේ සාමාජිකයින් පවා යම් යම් අපහසුතාවයන්ට ලක් වුවත් අපි ජනතාව සමග කටයුතු කරමින් ජනතා සේවයට කැපවී වැඩ කළ නිසා තමයි අද මේ විදියට සභාවට එන්න පුළුවන් කම ලැබුණේ.

නමුත් මේ පක්ෂ දේශපාලනය තුළ  අපි 1948 නිදහස ලැබීමෙන් පසුව ප්‍රජාතන්ත්‍රවාදිව මේ පාලනය කර ගෙන ආවත් 1969 ජනතා විමුක්ති පෙරමුණෙහි සංවිධාන ගත වීමත් සමග 1971දි පමණ මේ රටේ කැරැල්ලක් ඇති වුණා. මේ අවස්ථාවේ මගේ පියා ජෝර්ජ් රාජපක්ෂ මැතිතුමන්ට වැඩ කළ නිසා මේ කැරැල්ලේදි ඝාතනය කරන්න පවා සැලසුම් කළා. ජනතා විමුක්ති පෙරමුණේ පාවාදීම් වලින් වසර දෙකක් මගේ පියා සිරගත වෙලා හිටියා. එවකට අපේ පවුලේ සාමාජිකයින් අට දෙනෙක් සිටියා. ඒ කාලවකවානුව තුළ අපි ඉතා දුෂ්කර ජීවිතයක් ගත කළා. මෙවැනි කාල වකවානුවක් තුළ අපේ පවුලේ අය විතරක් නොවෙයි මුළු රටේම ආර් ථික හා සමාජීය වශයෙන් පරිහානියක් ඇති කරමින් ජනතාව කුපිත කරමින් කලහකාරි තත්වයක් ඇති කරන්නට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කළා. ඒ එදා තත්වය සේම අද තත්වය ගැන අපි කථා කළ යුතුයි. පසුගිය දිනක අපේ පක්ෂයේ නායකයාගේ හමුගැනිම වෙනුවෙන් එතුමා කැඳවීමක් කළහම ඒ සඳහා යන්න අපිට අයිතිය තියෙනවා. ඒක මොන පක්ෂයේ වුණත් ප්‍රජාතන්ත්‍රවාදි රජයක් තුළ තියන අයිතිවාසිකමක්. ඒක ශ්‍රි ලංකා නිදහස් පක්ෂයටත්, එක්සත් ජාතික පක්ෂයටත් එසේම යි. නමුත් පසුගිය දිනක අපි අපේ පක්ෂයේ නායකයාගේ සමුගැනීමට අරලිය ගහ මන්දිරයට ගිය අවස්ථාවේ සැලසුම් සහගත ලෙස අපිට පහරදීම සිදු කළා. මේ පිටුපස සිට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු  කල බව පැහැදිලියි. අපේ ගම් වල පවා අපේ නිවෙස් වලට පහර දෙන්න, ඒවා විනාශ කරන්න, නිවෙස් ඉදිරියෙන් පෙළපාලි යන්න අවශ්‍ය නැහැ. අපි දේශපාලනය කරන එක ඇත්ත නමුත් පක්ෂ දේශපාලනය තුළ ගම් වල ජනතාවට නායකත්වය දෙමින් කටයුතු කරනවා නම් තමන්ගේ පාක්ෂිකයින් නිති විරෝධි වැඩ වලින් නවත්වන්න ඒ නායකත්වය යොදා ගන්න ඕන. ඒක තමයි නියම නායකත්වය. මේ ක්‍රමය දිගින් දිගටම යන්න හොඳ නැහැ. ඒ නිසා චෝදනාවක් ලෙස නොවෙයි ඉල්ලීමක් ලෙස අපි ගම් වල ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමය රැකගෙන දේශපාලනය කරමුයි කියා සියලු දෙනාටම ස්තුති වන්ත වෙමින් මගේ  කථාව නිමා කරනවා.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, අපිට අයිතියක් තියෙනවා අපේ පක්ෂයේ නායකයා වෙනුවෙන් එවැනි දේවල් වලට යන්න. ඒකට කවුරුත් විරුද්ධ වෙන්න අවශ්‍ය නැහැ. ඒකට ප්‍රචණ්ඩත්වය ගේන්න අවශ්‍ය නැහැ.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

සියලු දෙනාගෙන්ම අවසරයි.  ගරු ප්‍රා.ස.ම. සුගත් සරබගේ මැතිතුමන් කියූ පරිදි අපි පසුගිය දිනක අරලිය ගහ මන්දිරයට ගියේ අපේ පක්ෂයේ නායකයාගේ සමුගැනිම වෙනුවෙන්. අපි කාටවත් පහර දෙන්න ගිය ගමනක් නොවෙයි. අපේ පක්ෂය විදියට අපේ පාක්ෂිකයින් ඒ අවස්ථාවට සහභාගි වුණා. නමුත් අපි ගෝල්ෆේස් පිටියට ගියේ නැහැ. අපි නැවත එද්දි මහරගමදී තමයි මේ පහර දීම සිදුවුණේ. මේ සඳහා කවුරු සැලසුම් කළාද කියන්න අපි දන්නේ නැහැ. නමුත් මේ පිටුපස්සේ විශාල ලෙස අපේ දේවල් උදුරාගත්තා. පක්ෂ දේශපාලනයට වඩා මංකොල්ලකෑමක් තමයි මම දැක්කේ. නමුත් අපේ ගම් වල ඒ දේවල් සිදුවුණේ නැහැ. අපි දේශපාලනය කරන්නේ ඡන්දයක් ආවොත් විතරයි. ගම්වල එකට කාලා බිලා ඉන්න අපි ඒ විදයට ගෙවල් විනාශ කිරීම කරන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ මා සමග එකට ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් තරග කළ කෙනා පවා මේ වෙලාවෙ ලොකු කැප කිරීමක් කරලා අපිට කිසිත් නොවෙන්න කටයුතු කළා. මේ අවස්ථාවල ගොඩක් එක් එක් අයගේ පෞද්ගලික තරහවල් තමයි ඉදිරියට එන්නේ. අනෙක් සභා වල සිදු වූ දේවල් වලට සාපේක්ෂව අපිට මුකුත් වුණේ නැහැ. ඒ ගැන සියලු දෙනාටම ස්තුති වන්ත වෙනවා.

## <u>10. - ස්තුතිය හා නිමාව.</u>

අද දින 2022 වර්ෂයේ මැයි මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනිම සඳහා සම්බන්ධ වූන  අපේ ගරු උප සභාපතිතුමන්, හිටපු ගරු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා

සහ ලේකම්තුමා, නිළධාරිතුමිය,  ඇතුළු සියළුම දෙනාටම ස්තූතිවන්ත වෙමින් අද දවසෙ සභාවෙ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 01.30 ට පමණ සභා කොමෝ සතුටින් විසිර ගියහ.

.........................

අයි. ජී. මහින්ද,

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.

අයි.ජී.මහින්ද
සභාපති
කටුවන ප්‍රාදේශීය සභාව